AL අපි Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

ශ්‍රේණිය -	13	තෙවන වාර පරීක්ෂණය - 2025	කාලය : පැය:- 02යි.
විෂයය :	කෘෂි විද්‍යාව	පත්‍රය : I	ඇතුළත්වීමේ අංකය } ....

උපදෙස්:- 1- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

2- ප්‍රශ්න අංක 01 සිට 50 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරා එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන පරිදි කතිරයක් (x) යොදා සළකුණු කරන්න.

1) වැවක අඩංගු කොටස් පහත දැක්වේ. එම කොටස් වලින් ඉටුවන කාර්යය නිවැරදිව පිළිවෙලින් දක්වා ඇත්තේ කුමන පිළිතුරේද?

රළපනාව, පිටවාන, සොරොව්ව, බිසෝ කොටුව

a. වැඩි ජලය ක්‍රමානුකූලව පිට කිරීම b. වැව් රළ පහරින් වැව් බැම්ම ආරක්ෂා කිරීම

c. පාලනයකින් යුක්තව ජලය පිට කිරීම d. ජලය පිටවීමේදී පීඩනය පාලනය කිරීම

(1) a, b, c, d (2) b, a, c, d (3) c, a, b, d (4) d, a, b, c (5) b, a, d, e

2) හරිත විප්ලවයේ බලපෑම් කිහිපයක් පහත දැක්වේ.

A- නව වැඩි දියුණුකළ භෝග ප්‍රභේද හඳුන්වා දීම B- කෘතීම පලිබෝධ නාශක භාවිතා කිරීම

C- රසායනික පොහොර වර්ග භාවිතා කිරීම D- යාන්ත්‍රික උපකරණ වර්ග භාවිතා කිරීම

සෞඛ්‍යය ගැටලු ඇතිවීම කෙරෙහි ඍජුවම බලපෑ සාධක ලෙස සැලකිය හැක්කේ,

(1) A, B හා C (2) A, C හා D (3) A, B හා D (4) B, C හා D (5) ප්‍රකාශ සියල්ලම බලපා ඇත.

3) භෝග ශාකවල පදුරු දැමීමට වැදගත්වන, බීජ ප්‍රරෝහණය ප්‍රවර්ධනය කරන ආලෝක වර්ණය වන්නේ,

(1) රතු (2) තැඹිලි (3) කහ (4) කොළ (5) නිල්

4) ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය රටාව හා වගා කන්න සම්බන්ධව මින් කුමක් සත්‍යවේ ද?

A – මහ කන්නයට නොවැම්බර් සිට පෙබරවාරි දක්වා කාලය අයත් වේ.

B - දෙවන අන්තර් මෝසම් සහ ඊසාන දිග මෝසමට අනුකූලව මහ කන්නයේ වගා කටයුතු සිදු කරයි.

C – දෙවන අන්තර් මෝසමේ සංවහන තත්ත්ව මඟින් වර්ෂාපතනය අධිකව ඇතිවේ.

D - ඍතු විපර්යාසයක් නොමැති බැවින් ශ්‍රී ලංකාවේ වගා කන්න තීරණය කරන වැදගත්ම සාධකය වර්ෂාපතනය වේ.

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.

(4) A, B හා C පමණි. (5) B, C හා D පමණි.

5) මෙම උපකරණය යොදා ගන්නේ කුමක් සඳහාද?

(1) සාපේක්ෂ ආර්ද්‍රතාවය මැනීම සඳහාය.

(2) ජලයේ උෂ්ණත්වය මැනීම සඳහාය.

(3) වර්ෂාපතනය මැනීම සඳහාය.

(4) වාෂ්පීකරණය මැනීම සඳහාය.

(5) වායුගෝලීය පීඩනය මැනීම සඳහාය.

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

6) පාෂාණවල රසායනික ජීර්ණය වඩාත් හොඳින් විස්තර කර ඇති පිළිතුර තෝරන්න.

(01) පාෂාණ ගලායන ජලයේ දියවී ඉවත්ව යාම
(02) ශාක මුල්වල වර්ධනය නිසා පාෂාණ ඔක්සිහරණයට ලක්වීම
(03) පාෂාණ මතින් ගලායන ජලය සමග ගමන් කරන ගල්කැට වැදී පාෂාණ කොටස් කැඩීයාම
(04) ජලාශ පතුලේ ඇති පාෂාණ මත ඇතිවන ජල පීඩනය නිසා පාෂාණ ඔක්සිකරණයට ලක්වීම
(05) මිනිසා විසින් පාෂාණ මත ශාක වගා කිරීම නිසා පාෂාණ ජීර්ණය වීම

7) සවිවරතාවය අඩුවී දෘෂ්‍ය ඝනත්වය වැඩිවිය හැකි අවස්ථාව මින් කුමක්ද?

(01) අවම බිම් සැකසීම යොදා ගැනීම
(02) පාෂාණවල සතුන් ගුල් හෑරීම
(03) පස මතින් වාහන ගමන් කිරීම
(04) පස ක්ෂාරීයතාවයට පත්වීම
(05) පසෙහි කාබනික ද්‍රව්‍ය වැඩිවී ගැඩවිල් ගහනය වැඩි වීම

8) පාංශු සෞඛ්‍යය කෙරෙහි බලපාන ගුණාංග කිහිපයක් පහත දැක්වේ.

A- pH අගය
B - කැටායන හුවමාරු ධාරිතාවය,
C- පාංශු උෂ්ණත්වය
D- පාංශු වාතනය
E- විද්‍යුත් සන්නායකතාවය

මේවා අතුරින් රසායනික ගුණාංග ඝනයට වැටෙන්නේ මොනවාද?

(01) B සහ C පමණි.
(02) C සහ D පමණි.
(03) C, D සහ E පමණි.
(04) B, D සහ E පමණි.
(05) A, C සහ D පමණි.

9) පහත මූල ද්‍රව්‍ය වලින් අත්‍යවශ්‍ය මහා ප්‍රාථමික මූල ද්‍රව්‍යයක්, අත්‍යවශ්‍ය මහා ද්විතියික මූල ද්‍රව්‍යයක්, අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූල ද්‍රව්‍යයක් හා උපකාරක මූල ද්‍රව්‍ය පිළිවෙළින් අඩංගු වරණය තෝරන්න.

වරණය	මහා ප්‍රාථමික මූල ද්‍රව්‍ය	මහා ද්විතියික මූල ද්‍රව්‍ය	ක්ෂුද්‍ර මූල ද්‍රව්‍ය	උපකාරක මූලද්‍රව්‍ය
(1)	Al	Si	B	Mo
(2)	Ca	K	Na	Co
(3)	K	Ca	Ni	Si
(4)	Zn	Fe	Ni	Co
(5)	N	S	Mn	Si

10) වී වගාවකට හෙක්ටයාරයකට P_2O_5 140.4Kg අවශ්‍ය වේ. පසෙන් P_2O_5 95.5Kg ලැබෙන අතර T.S.P. (P_2O_5 45%) සඳහා පොහොර භාවිත කාර්යක්ෂමතාවය 50%ක් නම් යෙදිය යුතු T.S.P. ප්‍රමාණය කොපමණද?

(1) 45.5Kg (2) 200Kg (3) 222Kg (4) 400Kg (5) 455Kg

11) ප්‍රාථමික සහ ද්විතියික බිම් සැකසීමේ උපකරණ පිළිබඳ වැරදියට දක්වා ඇති පිළිතුර තෝරන්න.

වරණය	ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ	ද්විතියික බිම් සැකසීමේ උපකරණ
(1)	පස පෙරළීම සහ පස මට්ටම් කිරීමට යොදා ගනී	කැට පොඩි කිරීම සහ පාත්ති දැමීමට යොදා ගනී.
(2)	බර හා ශක්තිමත් භාවය වැඩිය.	සැහැල්ලුය. වේගයෙන් ක්‍රියාකළ හැක.
(3)	පස පෙරළීම සිදු කරයි.	කැට පොඩි කිරීම සහ මට්ටම් කිරීම සිදු කරයි.
(4)	නගුල් වර්ග යොදා ගනී.	පෝරු වර්ග යොදා ගනී.
(5)	සමහර උපකරණ පසේ තද ස්ථර බිඳ හෙලයි.	සමහර උපකරණ ඇලි වැටි දැමීමට යොදා ගනී.

AL අපි Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

12) මූල ගැටිති පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ තෝරන්න.

A- නයිට්‍රජන් තිර කරන බැක්ටීරියාවන් වාසස්ථාන ලෙස රනිල ශාක මුල්වල සකස් කර ගනියි.

B- ජෛව පොහොරක් ලෙස ක්‍රියාකරමින් ශාකයට තිරකරන නයිට්‍රජන් ලබාදෙයි.

C- ශාකය පසෙන් ලබාගත යුතු නයිට්‍රජන් පෝෂක ප්‍රමාණය අඩු කරයි.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C නිවැරදිය.

13) ජල සම්පාදනය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- වර්ධන අවධිය අනුව පාරිභෝගික ජල භාවිතාව වෙනස් වේ.

B- ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාවය අඩු කිරීම සඳහා දළ ජල සම්පාදන අවශ්‍යතාවය අඩුකළ යුතුය.

C- පාංශු තෙතමන තත්වය අනුව ජලය සැපයීම සාර්ථකම ජල සම්පාදන කාලාන්තරය සෙවීමේ ක්‍රමයයි.

මේවා අතුරින් නිවැරදි ප්‍රකාශ ලෙස සැලකිය හැක්කේ

(1) A පමණක් නිවැරදියි. (2) B පමණක් නිවැරදියි. (3) A හා B පමණක් නිවැරදියි.
(4) A හා C පමණක් නිවැරදියි. (5) A, B හා C සියල්ල නිවැරදියි.

14) භෝගයක් සඳහා යොදා ඇති ජල සම්පාදන ක්‍රමයේ ජල සම්පාදන කාර්යක්ෂමතාවය 60% කි. වගා භූමියේ දෛනික වාෂ්පීකරණ උත්ස්වේදනය 15mmක නම් මෙම භෝගයට දිනකට ජල ප්‍රභවයෙන් නිකුත් කළ යුතු ජල ප්‍රමාණය කොපමණද?

(1) 25mm (2) 30mm (3) 35mm (4) 50mm (5) 100mm

15) ප්‍රභාසංස්ලේෂණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ආලෝක ප්‍රතික්‍රියාව වේගවත් කිරීම තුලින් ප්‍රභාසංස්ලේෂණ වේගය වැඩි කිරීම සිදුවේ.

(2) අඳුරු ප්‍රතික්‍රියාව හරිතලවයේ තයිලකොයිඩ පටලවල සිදුවන නිසා දහවල් කාලයේ සිදු නොවේ.

(3) ආලෝකය උපරිමව සැපයීමෙන් කෝපිවල ප්‍රභාසංස්ලේෂණය වැඩිවේ.

(4) වැඩි උෂ්ණත්වයේදී ප්‍රභාස්ංලේෂණ කාර්යක්‍ෂමතාවය C4 ශාකවලට වඩා C3 ශාකවලට වැඩිය.

(5). බොහෝ ශාකවල ප්‍රභාසංස්ලේෂණයේ සීමාකාරී සාධකය උෂ්ණත්වයයි.

16) ශාක හෝර්මෝන සහ එහි සුවිශේෂී කාර්යය අතර පවතින සම්බන්ධතාවය නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරේද?

වරණය	හෝර්මෝනය	කාර්යය
(1)	ඔක්සීන්	පාර්ශ්වික මුල් වර්ධනය නිශේධනය කිරීම
(2)	සයිටොකයිනීන්	පාර්ශ්වික අංකුර වර්ධනය උත්තේජනය කිරීම
(3)	ගිබරලික් අම්ලය	ආගන්තුක මුල් වර්ධනය උත්තේජනය කර ගැනීම
(4)	ඇබ්සිසික් අම්ලය	පූටිකා විවෘතවීම පාලනය
(5)	එතිලීන්	පුෂ්පීකරණය උත්තේජනය කිරීමට

17) සුප්තව ඇති බීජවල ජීව්‍යතාවය නිවැරදිව නිර්ණය කළ හැකි, බීජ පරීක්ෂාවන් දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ටෙට්‍රාසෝලියම් පරීක්ෂාව, 0.2% පොටෑසියම් නයිට්‍රේට් පරීක්ෂාව

(2) “X” කිරණ පරීක්ෂාව, ප්‍රරෝහණ ප්‍රතිශත පරීක්ෂාව

(3) ටෙට්‍රාසෝලියම් පරීක්ෂාව, පිටවන කාබන් ඩයොක්සයිඩ් පරීක්ෂාව

(4) පිටවන කාබන් ඩයොක්සයිඩ් පරීක්ෂාව, ප්‍රරෝහණ ප්‍රතිශත පරීක්ෂාව

(5) ටෙට්‍රාසෝලියම් පරීක්ෂාව, “X” කිරණ පරීක්ෂාව

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

18) වී වල බිත්තර බීජ මිලදී ගැනීමට යන ගොවියකුටලා නිල් පාට සහ ලා කොළ පාට ලේබල් ඇලවූ වී බීජ මිටි දක්නට ලැබිණි. මෙම ලේබල් භාවිතා කරනුයේ පිළිවෙළින්,

(01) සහතික කළ බීජ සහ අත්තිවාරම් බීජ සඳහාය.
(02) අත්ති වාරම් බීජ සහ සහතික කළ බීජ සඳහාය.
(03) ලියාපදිංචි බීජ සහ සහතික කළ බීජ සඳහාය.
(04) සහතික කළ බීජ සහ ලියාපදිංචි බීජ සඳහාය.
(05) අත්තිවාරම් බීජ සහ සහතික කළ බීජ සඳහාය.

19) බොහෝ ශාක, වර්ධක ප්‍රචාරණ ක්‍රමවලින් ප්‍රචාරණය කරනු ලැබේ. රූපයේ දක්වෙන වර්ධක ප්‍රචාරණ ක්‍රමය යොදාගෙන ප්‍රචාරණය කරගත හැකි බෝගය/ භෝග වනුයේ,

(1) උණ, ගම්මිරිස් හා සමන්පිච්ච
(2) වද, මිදි හා සමන් පිච්ච
(3) දෙහි, ලෙමන් හා බුලත්
(4) උණ, පෙයාර්ස් හා ඇපල්
(5) පෙයාර්ස්, රෝස හා දෙළුම් ය.



20) ජීවාණුහරණය පටක රෝපණයේදී ඉතා වැදගත්ය. රෝපණ මාධ්‍ය ජීවාණුහරණය සඳහා යොදාගන්නා ක්‍රම ලෙස සැලකිය හැක්කේ,

(1) තෙත් තාප ජීවාණුරණය, බැක්ටීරියා පෙරණයකින් පෙරීම
(2) බැක්ටීරියා පෙරණයකින් පෙරීම, රක්ත තප්ත වනතෙක් රත් කිරීම
(3) තෙත් තාප ජීවාණුහරණය, විරංජන කුඩු යොදා ගැනීම, බැක්ටීරියා පෙරණයකින් පෙරීම
(4) තෙත් තාප ජීවාණුහරණය, වියලි තාප ජීවාණුහරණය සහ රක්ත තප්ත වනතෙක් රත් කිරීම
(5) තෙත් තාප ජීවාණුහරණය, විරංජන කුඩු යොදා ගැනීම සහ ඇල්කොහොල් යොදා ගැනීම

21) භෝග වැඩි දියුණු කිරීමේදී දෙමුහුම් අභිජනනය යොදා ගැනීමේ ප්‍රධාන අරමුණු දෙකක් දක්වා ඇත්තේ පහත කුමන වරණයේද?

(1) භෝග වල අස්වනු ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වැඩි කරගැනීම
(2) භෝගවල විෂම යෝගීත්වය වැඩි කිරීම හා නව ජාන හඳුන්වා දීම
(3) ඒකාකාරී ගහනයක් ඇති කිරීම හා දෙමුහුම් දිරිය ලබා ගැනීම
(4) දෙමුහුම් අස්වනු ලබා ගැනීම හා නිලීවන අහිතකර ජාන ඉවත් කිරීම
(5) දෙමුහුම් දිරිය ලබා ගැනීම හා හිතකර ජාන පරම්පරාගත කිරීම

22) අඩු වර්ෂාපතනයක් සහිත උෂ්ණත්වය වැඩි වියලි කලාපයේ පිහිටා ඇති ගොවිපොළක විශේෂ පොලිතීන් උමං භෝග වගාව සඳහා යොදා ගැනීමෙන් ගොවීන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ,

(01) භෝග අවට පරිසරය අධික ආර්ද්‍ර බවට පත්වීම වලක්වා ගැනීම
(02) දිවා රාත්‍රී උෂ්ණත්ව වෙනස වැඩි කර ගැනීමට දිවා කාලයේ උමග තුල උනුසුම වැඩි කර ගැනීම
(03) අධික වර්ෂාපතනයෙන් භෝග ආරක්ෂා කිරීම
(04) පලිබෝධ නත්ව රසායනික ද්‍රව්‍ය වලින් තොරව වගාව පාලනය කිරීම
(05) ආලෝක තීව්‍රතාවය වැඩිකර ගැනීම

23) ඝන මාධ්‍ය තුල නිර්පාංශු භෝග වගාවේදී යොදා ගන්නා කිහිපයක් පහත දක්වා ඇත.

A. කොහුබත්   B. දහයියා අඟුරු   C. බොරලු   D. පොලිථීන්

මේවායින් ස්වාභාවික කාබනික මාධ්‍ය ලෙ සැලකිය හැක්කේ කුමන ඒවාද?

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) B හා C පමණි.
(4) A හා D පමණි.
(5) C හා D පමණි.

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

24) ශාක රෝග ත්‍රිකෝණයට අනුව ශාක රෝග තත්වයක් ඇති වීමට වැදගත් වන තත්ව වනුයේ,
(01) ධාරකයා, පරිසරය, කාලය
(02) ධාරකයා, පරිසරය, රෝග කාරකයා
(03) රෝග කාරකයා, පරිසරය, කාලය
(04) ධාරකයා, රෝග කාරකයා, කාලය
(05) රෝග කාරකයා, ධාරකයා, වාහකයා

25) ප්‍රවේසම් වියයුතු (ඉතා අඩු විෂ) කෘමි නාශකයක ලේබලයේ පහල දාරයේ පැහැය විය යුත්තේ
(01) රතු (02) කහ (03) නිල් (04) කොළ හෝ සුදු (05) රතු හෝ කහ

26) ආලෝක උගුල් භාවිතයෙන් පාලනයට යොමුවී ඇති පලිබෝධකයා/ පලිබෝධකයින් වන්නේ,
(01) කෙසෙල් ගුල්ලා (02) පළතුරු මැස්සා (03) ඉල් මැස්සා
(04) ගොයම් මකුණා (0) රතු පොල් ගුල්ලා

27) වාතයෙන් බෝවන රෝගයක් / රෝග සඳහා උදාහරණය ලෙස දැක්විය හැකි පිළිතුර තෝරන්න.
(01) අර්තාපල් කළු කොරළ රෝගය
(02) කපුවල බැක්ටීරියා අංගමාරය
(03) කෝපි මලකඩ රෝගය
(04) මෙහි (01) සහ (02) වරණ නිවැරදිය.
(05) මෙහි (02) සහ (03) වරණ නිවැරදිය.

28) පාංශු pH අගය රෝග පාලනයට යොදාගත හැකි අවස්ථාව පිළිබඳ නිවැරැදි ප්‍රකාශ්‍ය මින් කුමක්ද?
(1) ආම්ලික පසක් උදාසීන කිරීමෙන් සමහර දිලීර රෝග පාලනය කළ හැකිය.
(2) ලවණ පසක් උදාසීන කිරීමෙන් සමහර බැක්ටීරියා රෝග පාලනය කළ හැකිය.
(3) උදාසීන පසක් ආම්ලික කිරීමෙන් සමහර වටපණු රෝග පාලනය කළ හැකිය.
(4) උදාසීන පසකට හුණු යොදා භාෂ්මික කිරීමෙන් දිලීර රෝග පාලනය කළ හැකිය.
(5) පාංශු pH අගය යාමනය රෝග පාලනය සඳහා යොදාගත නොහැකිය.

29) ජාන වෙනස් කරමින් නිෂ්පාදනය කරන ආහාර සහ සකසන ලද ආහාර ජාන විකරණය කළ ආහාර නම් වේ. එම ආහාර නිෂ්පදනයේ හිතකර ප්‍රතිඵලයක් ලෙස සැකලකිය හැක්කේ,
(1) ආහාර වෙළෙඳපොළ තුල ජාන විකරණය කළ ආහාර වලට විශේෂ මිලක් හිමිවීම
(2) සමහර ජාන විකරණය කළ ආහාර භෝග පලිබෝධවලට වලට ඔරොත්තු දීම
(3) ජාන විකරණය කළ ආහාර භෝග ඕනෑම අහිතකර පරිසර තත්වයක් යටතේ වගාකළ හැකිය.
(4) බොහෝ රටවල් මෙම ආහාර නිෂ්පාදනය සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදීම
(5) රටවල් කිහිපයක් හැරුණු විට අනෙක් රටවල් මෙම ආහාර තහනම් කිරීම

30) මානව පෝෂණය සැපිරීමේදී ආහාර තේරීමේ නිර්නායක වලට අනුව ආහාරයක අඩුවෙන් අඩංගු විය යුතු හෝ අඩංගු වීම අනවශ්‍ය සංඝටක දක්වනුයේ කුමන පිළිතුරෙහිද?
(1) පිටි ආහාර, මස් , කිරි ආශ්‍රිත නිෂ්පාදන
(2) මාළු, පිටි ආහාර, සීනි
(3) පැණි රස, තෙල් අධික ආහාර, කිරි ආශ්‍රිත නිෂ්පාදන
(4) පැණි රසැති පළතුරු, පැණි රසකෑම, මස්
(5) පිටි ආහාර, තෙල් අධික ආහාර, එළවළු

31) අස්වනු ගබඩා කළ හැකි කාලය මත බෙදා දක්වන කල්තබා ගත නොහැකි හැකි අස්වනු පිළිබදව වැරදි ප්‍රකාශය අඩංගු පිළිතුර තෝරන්න.
(01) ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර හා බාහිර සාධක හේතුවෙන් විනාශ වේ.
(02) ප්‍රධාන වශයෙන් බාහිර සාධක හේතුවෙන් විනාශ වේ.
(03) අස්වැන්නේ බර හා ප්‍රමාණය වැඩිය.
(04) එක් ස්ථානයක දිගු කාලයක් ගබඩා කර තැබිය නොහැකිය.
(05) පිටත ආවරණය මෘදුය. ඉක්මනින් හානි වේ.

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers ,
Province Papers , Model Papers ලබා ගත හැක .

32) පසු අස්වනු හානි වලක්වා ගැනීමට මෙන්ම ආහාර පරිරක්ෂණය සඳහා යොදා ගන්නා ක්‍රියාවලි වන්නේ,

(1) අස්වනු වියලීම, ක්ෂණික ආහාර නිෂ්පාදනය සහ පැසවීම
(2) ලුණු දැමීම, ඔක්සිකාරක භාවිතය සහ ආකලන යෙදීම
(3) ආහාර ජීවාණුහරණය සහ සාන්ද්‍රීකරණය භාවිත කිරීම
(4) සරු කිරීමේ සහ ප්‍රබල කිරීමේ ක්‍රම භාවිත කිරීම
(5) ලුණු දැමීම, පරිරක්ෂක භාවිතා කිරීම, අස්වනු වියලීම

33) ගොවිපල සතුන්ගේ ආහාර සලාකවලට යොදා ගන්නා ශක්ති පරිපූරක කිහිපයකට උදාහරණ වන්නේ

(1) මත්ස්‍ය අන්නය , කරවල කුඩු සහ ඇට කටු අන්නය
(2) සෝයා බෝංචි අන්නය , සහල් නිවුඩු සහ පොල් පුන්නක්කු
(3) සෝයා බෝංචි අන්නය , බඩ ඉරිගු අන්නය සහ සුනු සහල්
(4) සහල් නිවුඩු , බඩ ඉරිගු අන්නය සහ සුනු සහල්
(5) එරබදු කොළ අන්නය , පොල් පුන්නක්කු සහ සෝයා බෝංචි අන්නය

34) කුකුළු පාලනය වයඹ පලාත තුළ සීග්‍රයෙන් ව්‍යාප්ත වීම සඳහා ඇති ප්‍රධාන විභවයක් ලෙස සැලකිය හැක්කේ,

(1) ශ්‍රමය අවශ්‍ය තරම් පැවැතීමයි.
(2) ඉඩකඩ බහුලවීම සහ දේශගුණය හිතකර වීමයි.
(3) වයඹ පලාත තුල කුකුළු මස් සඳහා ඉහළ ඉල්ලුමක් පැවැතීමයි.
(4) කුකුළු පාලනයට ආධාර උපදෙස් සපයන ආයතන පිහිටා තිබීමයි.
(5) සාන්ද්‍ර ආහාර ලෙස යොදා ගන්නා සහල් නිවුඩු සහ පොල් පුන්නක්කු පහසුවෙන් සපයා ගත හැකි වීමයි.

35) කෘතිම බිත්තර රක්කවීම සඳහා යොදා ගන්නා බිත්තර රක්කවන සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- පැතැලි ආකාරයේ බිත්තර රක්කවන (Incubaters) මට්ටම්ව පිහිටුවාගත යුතුය.
B- කැබිනට් ආකාරයේ බිත්තර රක්කවනයක බිත්තර විශාල සංඛ්‍යාවක් එකවර රක්කවිය හැකිය.
C- පැතැලි ආකාරයේ බිත්තර රක්කවනයක බිත්තර හැරවීම අතින් සිදුකරයි.

ඉහත ප්‍රකාශ වලින්නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ ලෙස සැලකිය හැක්කේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි. (5) A, B හා C නිවැරදිය.

36) ගව පැටවුන් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ඉපදුණු අවස්ථාවේ සිට කිරි වැරීම දක්වා කාලය පැටව් කාලය ලෙස හඳුන්වයි.
B – කිරි වැරීම මාස 2 - 3 ත් අතරදී සිදු කරනු ලැබේ.
C – කිරි වරන අවස්ථාව වනවිට සාන්ද්‍ර ආහාර මත සම්පූර්ණයෙන් ගව පැටවුන් යැපිය යුතුය.
D - ගව පැටවුන් සඳහා වාර්තා තබා ගැනීම උපතේ සිට සිදුකළ යුතුය.

ඉහත ප්‍රකාශ පිළිබඳ නිවැරදි පිළිතුර තෝරන්න.

(01) A හා B පමණක් නිවැරදියි (02) A හා C පමණක් නිවැරදියි (03) A හා D ප්‍රකාශ නිවැරදියි
(04) B හා C පමණක් නිවැරදියි (05) B සහ D පමණක් නිවැරදියි

37) ගවයින්ට වැලදෙන ගව රක්තාශ්‍රුවය යනු,

(01) ප්‍රතිශක්තිකරණය මඟින් වලක්වා ගත හැකි බැක්ටීරියා රෝගයකි.
(02) ප්‍රතිශක්තිකරණය මඟින් වලක්වා ගත නොහැකි බැක්ටීරියා රෝගයකි.
(03) ප්‍රතිශක්තිකරණය මඟින් වලක්වා ගත හැකි වෛරස් රෝගයකි.
(04) ප්‍රතිකාර කළයුතු මාරාන්තික දීර්ඝ රෝගයකි.
(05) ප්‍රතජීවක ලබාදිය යුතු ප්‍රොටසෝවාවන් මඟින් ඇතිවන රෝගයකි

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

38) කිරි ගව දෙනකගේ කිරි නිෂ්පාදනයට වැදගත් නොවන හෝර්මෝනය වන්නේ,

(01) ඊස්ට්‍රජන් (02) ප්‍රොජෙස්ටරෝන් (03) ප්‍රොලැක්ටීන් (04) ඔක්සිටොසීන් (05) තයිරොක්සින්

39) කුකුළන්ට වැළදෙන පුල්ලෝරම් හා ගම්බෝරෝ රෝග වෙන්කර හඳුනා ගැනීමට භාවිතා වන ලක්ෂණයක් අඩංගු වරණය තෝරන්න.

වරණය	පුල්ලෝරම්	ගම්බෝරෝ
(1)	සුදු පැහැයට පාචනය සිදු කිරීම	රතු පැහැයට පාචනය සිදු කිරීම.
(2)	ජම්බාලිය වටා සුදු පැහැති බදාමයක් මෙන් තිබීම.	ජම්බාලිය අවට පිහාටු තෙත් ව පැවතීම
(3)	රෝගී සතුන් මළානික වීම	රෝගී සතුන් මළානික මෙන්ම උදාසීනද වීම
(4)	කරමල හා තැල්ල සුදු පැහැ වීම	කරමල හා තැල්ලෙහි පැහැය වෙනස් නොවීම
(5)	විටින් විට වේදනාවෙන් කෑ ගැසීම.	විටින් විට වෙව්ලමින් කෑ ගැසීම.

40) විචල්‍ය සාධක පමණක් වෙනස් කරගෙන පවත්වාගෙන යන නිෂ්පාදන ක්‍රියාවලියක,

(01) මුළු නිෂ්පාදනය ක්‍රමයෙන් වැඩිවේ. (02) ආන්තික නිෂ්පාදනය ක්‍රමයෙන් අඩුවී නැවැත වැඩිවේ.

(03) සාමාන්‍ය නිෂ්පාදනයක්‍රමයෙන් අඩුවේ. (04) සාමාන්‍ය වියදම අඩුවී නැවත වැඩිවේ.

(05) ස්ථාවර වියදම අඩුවී නැවැත වැඩිවේ.

41) යෙදවුම් නිමවුම් සම්බන්ධතාවය විස්තර කරන්නේ

(1). නිෂ්පාදන ශ්‍රිතයන් මගිනි. (2). සම නිෂ්පාදන වක්‍ර හා සම පිරිවැය රේඛා මගිනි.

(3). නිෂ්පාදන හැකියා වක්‍රය මගිනි. (4). සම පිරිවැය රේඛා මගිනි.

(5). සම ආදායම් වක්‍රය මගිනි.

42) කෙසෙල් වල ඉල්ලුම් වක්‍රය Qd = 1000-6P වන අතර එහි P යනු මිල (රු/කි ග්‍රෑ) හා Qd යනු ඉල්ලුම් කළ ප්‍රමාණය (කිලෝග්‍රෑම් දහස්) වේ. සැපයුම් වක්‍රය Qs=280+3Psවන අතර එහි Qs යනු සැපයුම් ප්‍රමාණය (කිලෝග්‍රෑම් දහස්) වේ. කෙසෙල් වල සමතුලිත මිල හා ප්‍රමාණය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1). මිල රු: 40.00 සහ සමතුලිත ප්‍රමාණය කිලෝග්‍රෑම් දහස් 260

(2). මිල රු: 80.00 සහ සමතුලිත ප්‍රමාණය කිලෝග්‍රෑම් දහස් 520

(3). මිල රු: 100.00 සහ සමතුලිත ප්‍රමාණය කිලෝග්‍රෑම් දහස් 840

(4). මිල රු: 106.00 සහ සමතුලිත ප්‍රමාණය කිලෝග්‍රෑම් දහස් 1280

(5). මිල රු: 160.00 සහ සමතුලිත ප්‍රමාණය කිලෝග්‍රෑම් දහස් 1560

43) එළවළු ගොවීන් පහත තත්ව වලට මුහුණ දුන්නේය.

A- අධික වර්ෂාපතනය පැමිණීම B- ආනයනික අර්තාපල්වල මිල වැඩිවීම

ඉහත තත්වයේ ප්‍රථිඵලයක් ලෙස,

(1) එළවළු වල ඉල්ලුම වැඩිවේ.

(2) එළවළු වල ඉල්ලුම වැඩිවන අතර එළවළු වල සැපයුම අඩුවේ.

(3) එළවළු වල ඉල්ලුම වැඩිවන අතර එළවළු වල සැපයුම අඩුවීම නිසා එළවළු වල හිගයක් වෙළඳපොලෙහි නිර්මාණය වේ.

(4) එළවළු වල ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වී සැපයුම් වක්‍රය වමට විතැන් වී ස්ථාවර වේ.

(5) එළවළු වල ඉල්ලුමට සහ සැපයුමට ඉහත අර්තාපල්වල මිල වැඩිවීමේ බලපෑමක් නැත.

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

44) කාබනික කෘෂි කර්මයේ පාරිසරික අවාසියක් ලෙස සැලකිය හැක්කේ,

(01) ආහාරහා පෝෂණ සුරක්ෂිතතාවය අනාරක්ෂිත වීම

(02) ආර්ථික වශයෙන් ලාභදායි, ගුණාත්මක බවින් අඩු අස්වනු ලැබීම

(03) පස හා ජල දූෂණය වීමය.

(04) ජෛව විවිධත්වය පිරිහීමට කිරීමට දායක වීමය.

(05) කෙටි කාලීනව නිෂ්පාදනය අඩුවීමය.

45) නිෂ්පාදනයක අතුරුඵල තවත් නිෂ්පාදනයක යෙදවුම් ලෙස යොදාගන්නා ගොවිතැන් ක්‍රමය කුමක්ද?

(01) ජෛව ගතික ගොවිතැන (02) වියළි ගොවිතැන (03) සමෝධානිත ගොවිතැන

(04) උඩරට ගෙවතු වගාව (05) කාබනික ගොවිතැන

46) දේශගුණික විපර්යාස හදුනා ගැනීමට වර්ෂාපතනයේ සිදුවන වෙනස්කම් යොදාගනී. මීට අමතරව දේශගුණික විපර්යාස හදුනා ගැනීමට භාවිතාකළ හැකි සාදක වන්නේ,

(01) ගෝලීය සාමාන්‍ය උෂ්ණත්වය ඉහළ යාම (02) මුහුදු මට්ටම ඉහළ යාම

(03) ග්ලැසියර දියවීම (04) මෙයින් (01) හා 02) පිළිතුරු දෙකම නිවැරදිය.

(05) මෙයින් (01) , (02) හා (03) පිළිතුරු තුනම නිවැරදිය.

47) ශ්‍රී ලංකාව තුළ අඳ ගොවි අයිතිවාසිකම් සුරක්ෂිත කරන ලද්දේ කුමන පනත යටතේද?

(1) 1958 අංක 01 දරන කුඹුරු පනත (2) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත

(3) 1973 අංක 42 දරන කෘෂි ඉඩම් පනත (4) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත

(5) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත

48) දේශගුණික විපර්යාස නිසා මුහුදු මට්ටම ඉහල යාමෙන් ශ්‍රී ලංකාවේ මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව වගා කටයුතු වල යෙදෙන ගොවීන් පහසුවෙන් ගොදුරුවිය හැකි සමාජීය ගැටලුව කුමක්ද?

(01) වගාබිම් පහසුවෙන් ලවණතාවයට පත්වීම

(02) මුහද ගොඩ ගලන කාල මගහැර භෝග වගාවන් සැලසුම් කිරීමට අපොහොසත් වීම

(03) ධීවර ජනවාස මුහුදට යටවීම නිසා ධීවරයින් ඉහලින් ඇති වගාබිම්වල පදිංචි වීම

(04)) මිරිදිය ජල ප්‍රභව ක්‍රමයෙන් පරිහානියට පත්වීම

(05) ගොවියන්ට ගොවිතැන අත්හැරීමට සිදුවීමත්, ධීවර කටයුතු ජීවනෝපාය බවට පත් කර ගැනීමට සිදුවීම

49) මී උණ මිනිසුන්ට ආසාදනය වීම වැළැක්වීමට ගතයුතු ක්‍රියාමාර්ගයක් ලෙස සැලකිය නොහැකි පිළිතුර කුමක්ද?

(01) කුඹුරුවල ඇවිදින විට ආරක්ෂිත සපත්තු පැළදීම

(02) මීයන් *Leptospira interrogans* බැක්ටීරියාව සඳහා ප්‍රතිශක්තිකරණය කිරීම

(03) මී ගහනය අඩු කිරීමට උපක්‍රම භාවිතා කිරීම

(04)) මීයන් වගාබිම් වෙත පැමිණීම වැලැක්වීම සඳහා විවිධ උපක්‍රම යෙදීම

(05) ගොවියන්ට ප්‍රතිජීවක ලබාදීම

50) එළකිරි නිෂ්පාදනය සඳහා ඉහළම දායකත්වය සපයන සත්තව පාලන කලාපය වන්නේ මින් කුමක්ද?

(01) උඩරට තෙත් කලාපය (02) මැදරට තෙත් කලාපය (03) පහත රට තෙත් කලාපය

(04) පොල් ත්‍රිකෝණය (05) වියලි කලාපය

AL අපි Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers ,
Province Papers , Model Papers ලබා ගත හැක .

{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

ශ්‍රේණිය - 13 | තෙවන වාර පරීක්ෂණය - 2025 | කාලය : පැය:- 03යි වි. 10යි.

විෂයය : **කෘෂි විද්‍යාව** | පත්‍රය : **II** | ඇතුළත්වීමේ අංකය } ....

උපදෙස්:- 1 - සනක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු නොලැබේ.

2 - මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය. පිළිතුරු සැපයීමට නියමිත කාලය පැය 03 විනාඩි10 කි.

''A'' කොටස ව්‍යුහගත රචනා - සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. කෙටි පිළිතුරු සපයන්න.

''B'' කොටස රචනා - ප්‍රශ්න 6 කින් සමන්විතය. ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සපයන්න.

''A'' කොටස ව්‍යුහගත රචනා තෙවන

01. (A). ශ්‍රී ලංකාවේ කෘෂි කර්මය පිළිබඳ ප්‍රකාශ 5ක් පහත දැක්වේ. ප්‍රකාශය නිවැරදි නම් වරහන තුළ (T) ද, වැරදි නම් වරහන තුළ (F) යොදන්න.

1) වගා රක්ෂණය මඟින් ගොවිතැනේ අවධානම හා අඩමානය අඩු කරන නමුත් තිරසර බව නැති කරයි. (........)

2) වැවිලි භෝග ලෙස තේ, රබර්, පොල් මඟින් ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමයක් උපයයි (........)

3) යථා තත්‍ය ගොවිතැන සංරක්ෂණය ගොවිතැන් ක්‍රමයක් ලෙස අතීතයේදී යොදාගත් වගා ක්‍රමයකි. (........)

4) කෘෂි කර්ම දෙපාර්තමේන්තුව බීජ පනත ක්‍රියාත්මක කරයි. (........)

5.) එල්ලංගා පද්ධතිය ජලය ප්‍රති භාවිතය සඳහා උදාහරණයකි. (........)

(B) (i). a- කාළගුණික මධ්‍යස්ථානයක සවිකර අති සූර්ය දීප්තමානයේ භාවිතාවය සඳහන් කරන්න.

....

b- පහත දැක්වෙන සූර්යදීප්ත මානයේ කොටස් නම් කරන්න.



A. ....

B ....

C...

c- දැඩි සුළඟේ අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

1..

2..

(C) (i). සෞඛ්‍යමත් පසක් යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

....

....

....

(ii). සෞඛ්‍යමත් පසක ලක්ෂණ දෙකක් ලියන්න.

1...

AL අපි Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය **Past Papers , School Papers , Province Papers , Model Papers** ලබා ගත හැක .

2...

(iii). පාංශු සෞඛ්‍යය පිරිහීමට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

1...

2...

(iv). පාංශු සෞඛ්‍යය වැඩි දියුණු කිරීමට ගතහැකි පියවර දෙකක් සඳහන් කරන්න.

1...

2...

(D) (i). කාබනික පොහොර භාවිතයෙන් පසේ පහත සඳහන් පාංශු තත්වයන් වෙනස්වන අයුරු ලියා දක්වන්න.

a) පාංශු ව්‍යුහය -

....

....

b) පෝෂක සුලභතාවය -

....

....

c) පාංශු ජල ධාරිතාව -

....

....

(ii). අමිශ්‍ර පොහොර හා මිශ්‍ර පොහොර අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

1...

....

2...

....

(E) (i). බිම් සැකසීමේදී යොදා ගන්නා අවම සහ ශුන්‍ය බිම් සැකසීම අතර වෙනස් කම් 3ක් සඳහන් කරන්න.

ශුන්‍ය	අවම
1..	....
2..	....
3..	....

(ii) විශේෂ තවාන් වර්ග 3ක් උදාහරණ ලෙස යොදාගත හැකි භෝග වර්ගයක්ද සමඟ සඳහන් කරන්න.

1..	....
2..	....
3..	....

(F) (i). සුළඟ අධික ප්‍රදේශයකට භාවිතා කළ හැකි ජලසම්පාදන ක්‍රම දෙකක් හා භාවිතා කළ නොහැකි ජලසම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න.

භාවිතා කළ හැකි	භාවිතා කළ නොහැකි
a.	a. ....
b.	b. ....

(ii). මෙවැනි ක්ෂේත්‍රයක ජල හානිය වැඩි විය හැකි ආකාර **තුනක්** ලියා දක්වන්න.

a. ....

b. ....

c. ....

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

02. (A)(i). a- ශාකයක ප්ලෝයම තුලින් පරිවහනය වන ද්‍රව්‍ය 2ක් සඳහන් කරන්න.

1.. 2..

b- ප්ලෝයම පරිවහනය සිදුවන බව පෙන්විය හැකි අවස්ථා 2ක් සඳහන් කරන්න.

1..

2..

(ii). ශාකයකට ජලයේ ඇති වැදගත්කම් 4ක් දක්වන්න.

1..

2..

3..

4..

(B) ගබඩා කර ඇති 2500Kg වී බීජ තොගයක ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂාවකදී සිදුකළ පහත ක්‍රියාකාරකම් සඳහා හේතු පැහැදිළි කරන්න.

(i). අහඹු ලෙස බීජ නියැදි ලබා ගැනීම

....

(ii). ලබාගත් අහඹු නියැදි ගණන කීයද?

....

(iii). ලබාගත් අහඹු නියැදි එකට මිශ්‍ර කොට නව නියැදියක් සැකසීම

....

....

(iv). ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමේ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

1..

2..

(C) (i). විවිධ ස්වාභාවික අලිංගික ප්‍රචාරණ ක්‍රම පහත දැක්වේ. හඳුනාගෙන එක් එක් වර්ගය යොදා ප්‍රචාරණය කරන ශාක 2ක් බැගින් ලියන්න



ප්‍රචාරණ ක්‍රමය — උදාහරණ

1 ....

2 ....

3 ....

(ii). අලිංගික ප්‍රචාරණයේ වැදගත්කම් 2ක් සඳහන් කරන්න.

1..

2..

(D) (i). ජාන සම්පත් ආරක්ෂා කිරීමට ස්ථානීය හා පරිබාහිර සංරක්ෂණය යොදා ගනී. ස්ථානීය සංරක්ෂණයේ ගැටළු 2ක් සඳහන් කරන්න.

1..

2..

AL අපි Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(ii). ස්ථානීය හා පරිබාහිර ශාක සංරක්ෂණ ස්ථානවලට ශ්‍රී ලංකාවේ උදාහරණ (2) බැගින් සඳහන් කරන්න.

ස්ථානීය .... පරිබාහිර

1.. 1..

2.. 2..

(E) (i). පාලිත තත්ව යටතේ භෝග වගාව ශ්‍රී ලංකාව තුළ යොදා ගැනීමේ සීමාවීමට හේතු දෙකක් ලියන්න.

1..

2..

(ii). පාලිත තත්ව යටතේ භෝග වගාව ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කිරීමට යෝජනා දෙකක් ලියන්න.

1..

2..

(F) නිර්පාංශු වගාව සඳහා යොදා ගන්නා ඝන මාධ්‍ය වගා ක්‍රම 4 සඳහන් කරන්න. එම ක්‍රමයට වගාකළ හැකි භෝග දෙකක් බැගින් ලියන්න.

1..

2..

3..

4..

03. (A) (i). පහත දැක්වෙන පාඨ නිර්වචනය කරන්න.

1. පලිබෝධකයකුගේ ආර්ථික දේහලීය මට්ටම

....

....

2. පලිබෝධකයකුගේ ආර්ථික හානිදායක මට්ටම

....

....

(ii). පලිබෝධකයකුගේ ගහන ඝනත්වය දැන ගැනීමේ ප්‍රධාන වාසි තුනක් සඳහන් කරන්න.

1..

2..

3..

(B) (i). ''බහුවාර්ෂික වල්පැළෑටි'' අර්ථ දක්වන්න.

....

....

(ii). ආගන්තුක ආක්‍රමණශිලි වල්පැළෑටි ව්‍යාප්ත වන ක්‍රම තුනක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

(C) ශාකවලට වැළඳිය හැකි බෝ නොවන රෝග වර්ග 2ක් සඳහන් කරන්න.

1. .... 2..

(D) (i). පසු අස්වනු තාක්ෂණය භාවිතයේ වාසි සහ භාවිතය සීමා වීමට හේතු දෙක බැගින් සඳහන් කරන්න.

වාසි

1..

2..

AL අපි Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

සීමා

1..

2..

(iii). එළවළු වල පරිනත දර්ශක 3ක් සඳහන් කරන්න. උදාහරණ ලෙස එළවළු වර්ග 3ක්ද සඳහන් කරන්න.

1..

2..

3..

(E) පහත සඳහන් ආහාර නිෂ්පාදන ඇසිරීම සඳහා වඩාත් සුදුසු ඇසුරුම් වර්ගය සඳහන් කරන්න.

ආහාර වර්ගය	ඇසුරුම් වර්ගය
1 චොක්ලට්	....
2 බනිස්	....
3 පානීය ජලය	....
4 රසකළ කිරි	....

(F) (i). දීර්ඝ කාලයක් ආහාර අඩුවෙන් ලැබීම නිසා ඇතිවන දුෂ්පෝෂණ ආකාරය සඳහන් කරන්න.

....

(ii). ප්‍රෝටීන් සහ ශක්ති ඌනතාවය නිසා ඇති විය හැකි ප්‍රධානතම රෝගී තත්ව දෙක සඳහන් කරන්න.

1. .... 2..

(iii). ආහාර හිගයට අමතරව ඌනතා රෝග ඇතිවීමට බලපාන වෙනත් සාධක දෙකක් සඳහන් කරන්න.

1. .... 2..

(iv). දියවැඩියා රෝගී තත්වය ඇතිවීමට හේතු වී ඇති ආහාර පුරුදු **දෙකක්** සඳහන් කරන්න.

a. . ...

b. . ...

(G) (i). දේශගුණික විපර්යාස නිසා කෘෂි කර්මාන්තයට ඇතිවී ඇති ගැටළු 2ක් සඳහන් කරන්න.

1..

2..

(ii). දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමට භෝග වගාව තුල කල හැකි වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

1..

2..

04. (A) පහත ප්‍රස්ථාරයේ දැක්වෙන්නේ එළදෙනකගේ රුධිරයේ හෝමෝනවල සිදුවන වෙනස් වීමයි.



AL අපි Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(i). එළදෙනගේ මද චක්‍රයේ කාල සීමාව දක්වන්න. ....

(ii). A අවස්ථාවේ එළදෙන පෙන්නුම් කරණ ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

(iii). B හා C යන හෝමෝන නමකර, ස්‍රාවය වන ස්ථාන සඳහන් කරන්න.

B - ....

C - ....

(iv). B හෝමෝනය මඟින් කෙරෙන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

(B) (i). කුකුළු පෝෂණය සඳහා භාවිතා කරන ආහාර සලාක වර්ග නම් කරන්න.

බිත්තර කිකිළියන් සඳහා 1..
2..
3..

බ්‍රොයිලර් කුකුලන් සඳහා 1..
2..

(ii) බිත්තර කිකිළියන් පෝෂණයේදී පහත දැක්වෙන පෝෂක වල කාර්යය බැගින් සඳහන් කරන්න.

1. ප්‍රෝටීන

....

2. කාබෝහයිඩ්‍රේට

....

3. කැල්සියම්

....

(C) (i). පහත දක්වෙන නිෂ්පාදන සාධක අතර දැකිය හැකි ප්‍රධාන වෙනස්කම බැගින් දක්වන්න.

1. ශ්‍රමය සහ ව්‍යවසායකත්වය

....

....

2. භූමිය සහ ප්‍රාග්ධනය

....

....

(ii). ශ්‍රමයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

(D) නිෂ්පාදන ක්‍රියාවලියක පහත දැක්වෙන පිරිවැය වක්‍ර දළ වශයෙන් ඇඳ පෙන්වන්න. ප්‍රස්ථාරයේ අක්ෂ නම් කරන්න.

1. සාමාන්‍ය පිරිවැය 2. ආන්තික පිරිවැය
3. සමාන්‍ය විචල්‍ය පිරිවැය 4. සමාන්‍ය ස්ථාවර පිරිවැය

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers ,
Province Papers , Model Papers ලබා ගත හැක .



(D) (i). කාබනික ගොවිතැනක ලක්ෂණ 4ක් සඳහන් කරන්න.

1...

2...

3...

4...

(ii). මිශ්‍ර භෝග වගාවේ වාසි දෙකක් සඳහන් කරන්න.

1...

2...

(iii). සත්ව භෝගමාරුවේ සීමාකාරී සාධක දෙකක් සඳහන් කරන්න.

1...

2...

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

B කොටස - රචනා

ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සපයන්න.

5. (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන බහු කාර්ය සංවර්ධණ යෝජනා ක්‍රමවල අරමුණු පැහැදිලි කරන්න.
(ii) ඒකාබද්ධ පළිබෝධ පාලනයේ වැදගත්කම විස්තර කරන්න.
(iii) පාංශු ජලයේ කෘෂි කාර්මික වැදගත්කම විස්තර කරන්න.

6. (i) ආහාර පරිරක්ෂණ ක්‍රම විස්තර කරන්න.
(ii) තවාන් පාත්තියක් බීජ තවාන් දැමීමට සකස් කරන ආකාරය විස්තර කරන්න.
(iii) කෘෂි පාරිසරික කලාප සිතියමේ වැදගත්කම විස්තර කරන්න.

7. (i) විවිධ බද්ධ කිරීමේ ක්‍රම විස්තර කරන්න.
(ii) කාබනික පොහොර භාවිතයේ වාසි අවාසි පැහැදිලි කරන්න.
(iii) පලිබෝධ නාශක භාවිතයේදී යෙදිය යුතු ආරක්ෂක පිළිවෙත් පැහැදිලි කරන්න.

8. (i) ශාක අභිජනනයේ දි යොදා ගන්නා විකෘති අභිජනන ක්‍රම විස්තර කරන්න.
(ii) මතුපිට ජලසම්පාදන ක්‍රම විස්තර කරන්න.
(iii) තෘණ සංරක්ෂණය කළහැකි ආකාර විස්තර කරන්න.

9. (i) රැක්කවීමට ගන්නා බිත්තරවල තිබිය යුතු ලක්ෂණ පැහැදිලි කරන්න.
(ii) පාලිත තත්ව යටතේ භෝග වගාවේ අරමුණු විස්තර කරන්න.
(iii) ඔක්සීන සහ සයිටොකයනීන කෘෂිකර්මාන්තයේදී භාවිතා කරන ආකාරය පැහැදිලි කරන්න.

10. (i) සතුන්ගේ ප්‍රධාන රෝග ලක්ෂණ විස්තර කරන්න.
(ii) පසු අස්වනු හානි සිදුවන අවස්ථා උදාහරණ සමගින් පැහැදිලි කරන්න.
(iii) බීජවල සුප්තතාවය ඉවත් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.